**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**"රුහුණු ගුරුගෙදර" ගුවන්විදුලි අධ්‍යාපනික වැඩසටහන**

**ප්‍රාථමික අංශය - 4 ශ්‍රේණිය**

**මවුබස**

**පාඩම 8**

**ක්‍රියාකාරකම 1**

**පහත වැකි කියවන්න.**

වෛද්‍යරත්න වෙදමහතා වෙදකමට ඉතා දක්‍ෂයෙකි.

සුමුදු ධෛර්යවන්ත ව දෛනික කටයුතුවල යෙදෙයි.

වෛද්‍යවරයා තෛලයක් ගෙනාවේ ය.

ශෛලමය ලිපි පෞරාණික උරුමයන් වේ.

මල්ලී නෛයඩි වන්නම නටයි.

ඉහත වැකිවල **'ඓ '** ශබ්දය යෙදුන වචන යටින් ඉරි අඳින්න.

**ක්‍රියාකාරකම 2**

**' 'ඓ ' ශබ්දයට අනුව නිවැරදි වචනය තෝරන්න.**

| | | |
|---|---|---|
| වෛරය | වයිරය | වෙයිරය |
| දෙයිවය | දෛවය | දයිවය |
| කෙරාටික | කෙයිරාටික | කෛරායීක |
| නෛයිතික | නෛතික | නයිතික |

**ක්‍රියාකාරකම 3**

මෙම වචන යොදා වැකි ලියන්න.

වෛද්‍යවරයා -- ..........................................................................

දෛනික -- ..........................................................................

ශෛලමය -- ..........................................................................

මෛත්‍රිය -- ..........................................................................

**පාඩම 9**

**පිලි සහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම.**

**පහත සඳහන් ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

පුංචි කඳුගැටයක් උඩ ලස්සන ම ලස්සන පුංචි ගෙයක් තිබුණා. මේ ගෙය හදලා තිබුණේ ලැලිවලින්. ගෙදර තිබුණු බඩුමුට්ටුත් ලැලිවලින්මයි හදලා තිබුණේ. මේ පළාතට විදුලිය තිබුණේ නැහැ. ලාම්පු එළියෙන් තමයි රාත්‍රියට වැඩ කරන්නේ.

කන්ද පාමුල පුංචි විලක් තිබුණා. ඒ විලේ මාළුන් පිරිලා හිටියා. විල වටේ ම ලිලී මල් ගස්වල මල් පිරිලා හරි ම ලස්සන යි. මේ ගෙදර ජීවත් වුණේ ආච්චි අම්මෙකුයි, දුවෙකුයි. ආච්චි අම්මා ලීලාවතී . පුංචි දුවගේ නම ලිලී. ආච්චි අම්මා කෑම වර්ග හදලා ඒවා විකුණලා තමයි ජීවත් වුණේ. ලැවරියා, ලුණු දෙහි, ලූනු බැදුම් හරි ම රසට හදලා බෝතල්වල දාලා නගරයට ම යවනවා. පුංචි ලිලී ලූනු ලෙලි ඇරලා සුද්ද කරලා දීලා ආච්චිට උදවු කළා. මේ කෑම වර්ග නගරයට ම අරගෙන ගියේ ලයනල් කියලා මාමා කෙනෙක්. මාමා රැකියාව කළේ ලුණු ලේවායේ.

ටික කලක් ගත වුණා. ආච්චි අම්මා ලයනල් මාමාට කියලා හැම ඉරිදා ම ලොතරැයි ටිකට් එකක් ගෙන්වා ගත්තා. නගරයට ගියා ම ලයනල් මාමා ලොතරැයි දිනුම්වල අංක ආච්චිට ලියලා ගෙනවිත් දෙනවා. දවසක් දා ආච්චිගේ ටිකට් එකකට ලොකු ම දිනුමක් ඇදිලා. ආච්චි ලොතරැයි මණ්ඩලයට ලිපියක් ලියලා ලයනල් මාමා අතට දුන්නා තැපැල් කරන්න. ලිපිය ලැබුණු හැටියේ ම ලොතරැයි මණ්ඩලයෙන් ලිලීගේ ගෙදර සොයාගෙන ආවා. ආච්චි අම්මාත්,ලිලීත් නගරයට ම එක්කරගෙන ගිහින් ලොතරැයි දිනුමේ මුදල් ලබා දුන්නා. ආච්චි අම්මා කෑම හදන ව්‍යාපාරය තව දියුණු කර ගත්තා. ලයනල් මාමාටත් මුදලක් තෑගි ලෙස ලබා දුන්නා. එදා ඉඳලා ලිලී හා ආච්චි අම්මා හරි සතුටින් ජීවත් වුණා.

**ක්‍රියාකාරකම 01**

01.ඡේදය කියවා එහි සඳහන් කරුණු අවබෝධ කරගෙන චිත්‍රයක් අඳින්න.

02.චිත්‍රයට ගැළපෙන වචන හතරකට නොඅඩු වැකි තුනක් ලිඛිත බසින් ලියන්න.

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

**පාඩම 10**

**විරාම ලකුණු**

**ක්‍රියාකාරකම 01**

පහත දැක්වෙන ඡේදයේ ඇති විරාම ලකුණු ගැන අවධානය යොමු කරමින් ඡේදය කියවන්න.

"ආදි පටන් එන ජාති සිරිත් අපෙ දීපෙ දනෝ රකිතී

නාග ලොවින් ගෙන ආව බුලත් අත තාම රටේ පවතී"

යනුවෙන් සීයා කතාවට මුල පිරුවේ ය.

" නාග ලොවින් ගෙන ආවා කියන්නේ මොකක් ද සීයේ? " මම ඇසුවෙමි.

"පුතේ, මේ කවියෙන් කියන්නේ බුලත් ගැන. බුලත් නාග ලොවින් ආවා කියන කතාව හරි ලස්සන කතාවක් " යැ යි සීයා පැවසුවේ ය.

"නාග ලෝකේ! " මම පුදුමයෙන් ඇසුවෙමි.

"ඔව් පුතේ නාග ලෝකෙන් තමයි. " සීයා පිළිතුරු දෙමින් නැවතත් කතාව කියන්නට පටන් ගත්තේ ය.

## ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන විරාම ලකුණු හඳුන්වන්න.

. -

? -

" " -

, -

! -

## ක්‍රියාකාරකම 03

සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

1. නායක සිටුතුමනි මේ අඹ වර්ගය අනුභව කළාට වරදක් නැද්ද

   ....................................................................................................

2. පුරෝහිත මේ මහ රෑ ඇසුණු ශබ්දය කුමක් ද

   ....................................................................................................

3. වෛද්‍ය සායනය පැවැත්වෙන්නේ කොහේ ද

   ....................................................................................................

4. මම පූජාවට මල් තෙල් හඳුන්කූරු රැගෙන ගියෙමි

   ....................................................................................................

5. නායකතුමා ගස ළඟට පැමිණ ගස ද එල ද හොඳින් පරීක්ෂා කළේ ය

   ....................................................................................................